21st Academic Sessions 2024
University of Ruhuna
Matara, Sri Lanka
https://www.ruh.ac.lk/index.php/en/
ISSN: 2362-0412

# දළදා පෙරහැරෙහි හස්ති වස්ත්‍රාහරණකරණයෙහි වන අනන්‍යතා ලක්ෂණ පිළිබඳ ගවේශනාත්මක අධ්‍යයනයක්



පී. එස්. ගොඩකන්ද සහ එච්. පී. විමලසිරි*

*සිංහල අධ්‍යනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර.*

## සාරසංක්ෂේපය

පෙරහැර සිංහල සංස්කෘතිකාංග අතර ප්‍රමුඛත්වයෙහිලා සැලකෙයි. ඒ අතරින් මහනුවර දළදා පෙරහැර ප්‍රධාන වෙයි. ඒ හා සම්බන්ධ සකලවිධ අංගයන් අතර හස්තියාගේ භූමිකාව සුවිශේෂ වූවකි. කරඬුව වැඩම කරවන මංගල හස්තිරාජයාගේ සිට පෙරහැරට සම්බන්ධ වන සෙසු සෑම හස්තියෙකුගේ ම දර්ශනීයත්වය හා විචිත්‍රත්වය රඳා පවතින්නේ ඔවුන්ගේ ඇඳුම් පැළඳුම් මත ය. විවිධ වර්ණයෙන් හැඩයෙන් හා අලංකාර මෝස්තරවලින් සමලංකෘතව නිමවන එම ඇඳුම් විලාසිතා හස්තියාට උරුම මහේශාඛ්‍යබව, ගර්වය හා භක්තිය තීව්‍ර කරන අතර ප්‍රේක්ෂක ආකර්ෂණය දිනා ගැනීමෙහි ද මුඛ්‍ය සාධකය බවට පත්වෙයි. එම හස්ති වස්ත්‍ර නිර්මාණයකරණය විවිධ සම්ප්‍රදායයන් අනුව විවිධ ලක්ෂණ පෙන්වයි. එබැවින් දළදා පෙරහැරෙහි අලි ඇතුන් වෙනුවෙන් නිමවන හස්ති වස්ත්‍රාහරණ කට්ටලයේ විශේෂතා, ඒ සමඟ බැඳුනු වත්පිළිවෙත් සහ භූෂණ පරම්පරා පිළිබඳ ව ගවේශනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ යි. පෙරහැර සංස්කෘතිය තුළ දළදා පෙරහැර සහ දළදා මාළිගාව හා බැඳුනු හස්ති වස්ත්‍රාහරණකරණය විශේෂ වන්නේ කෙසේ ද යන්න සොයා බැලීම මෙහි පර්යේෂණ ගැටලුව යි. ඒ සඳහා ප්‍රධාන මූලාශ්‍රය ලෙස ප්‍රාමාණික උගතුන්ගේ අදහස්, ශාස්ත්‍රීය ලේඛන සහ පර්යේෂණ නිබන්ධ ඇසුරු කෙරිණි. ඊට අමතරව මහනුවර දළදා මාළිගාවේ ලේකම් තුමා, ගජනායක නිලමේ, මංගල හස්තියාගේ භූෂණ කාර්යය සිදු කරන ජයතිස්ස ඇහැළමල්පේ මහතා, පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය අශෝක දංගොල්ල මහතා සහ දළදා මාළිගාවට අනුබද්ධිත හස්ති වස්ත්‍ර නිර්මාණ ශිල්පීන් හමු වී සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලි මගින් තොරතුරු එක් රැස් කෙරිණි. අලි ඇතුන් වෙනුවෙන් නිර්මාණය වන හස්ති වස්ත්‍රාහරණ කට්ටලය විධිමත් ආකාරයකට සකස් වූයේ දළදා මාළිගාව සහ දළදා පෙරහැර මූලික කරගෙන යි. පසුකාලීනව විවිධ සම්ප්‍රදායන් යටතේ විකාසනය වුව ද තවමත් හස්ති වස්ත්‍රාහරණකරණයෙහි නියුතු ශිල්පීන් ගුරු කොට ගන්නේ දළදා මාළිගයෙහි හස්ති වස්ත්‍රාහරණකරණය යි. එබැවින් තිරිසන්ගත සත්ත්වයෙකු වස්ත්‍රාහරණයෙන් සැරසීම සිංහල සංස්කෘතිය හා බැඳුණු විශේෂ කරුණක් වන්නා සේ ම හස්තියාගේ වස්ත්‍රාහරණ නිර්මාණය හා භූෂණය ගෞරවය හා භක්තිය පදනම් කරගත් සංස්කෘතික අංගයක් ලෙස විකාසනය වීමේ දී මහනුවර දළදා මාළිගාව හා මහනුවර දළදා පෙරහැර හා බැඳුනු හස්ති වස්ත්‍රාහරණකරණය විශේෂ වන බව මෙමගින් නිරීක්ෂණය වෙයි.

*ප්‍රමුඛ පද* **: අනන්‍යතා ලක්ෂණ, දළදා පෙරහැර, පෙරහැර සංස්කෘතිය, හස්ති වස්ත්‍රාහරණ, සංස්කෘතික අගය**

***Corresponding Author**: *pabasarasev@gmail.com*